# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# 2026 දෙසැම්බර් 03 සිට 06 දක්වා චීනයේ හයිනාන් හි පැවැත්වෙන, 2026 හයිනාන් ශීත සෘතු වෙළඳ ප්‍රදර්ශනයේ (HAINAN WINTER TRADE FAIR 2026) ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), චීන මහජන සමූහාණ්ඩුවේ ගුවැංෂූ හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය හා එක්ව **2026 දෙසැම්බර් 03 සිට 06**දක්වා චීනයේ හයිනාන් හි පැවැත්වෙන "**2026 හයිනාන් ශීත සෘතු වෙළඳ ප්‍රදර්ශනය**" සඳහා ශ්‍රී ලංකා මණ්ඩපයක් සංවිධානය කරනු ලබයි.

හයිනාන් ශීත සෘතු වෙළඳ ප්‍රදර්ශනය යනු ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ හයිනාන් ප්‍රදේශයේ නිදහස් වරාය පහසුකම්වලින් ප්‍රයෝජන ලබමින් චීන වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යාප්ත කිරීමට ඇති විශිෂ්ට වේදිකාවකි.

ලොව දෙවන විශාලතම ආර්ථිකය හිමි චීනය, ශ්‍රී ලාංකීය කුළුබඩු සහ අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සිය වෙළඳපොළ ක්‍රමයෙන් විවෘත කරමින් සිටී. ශීඝ්‍ර සංවර්ධනයක් සහ ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් සහිත මිලියන සංඛ්‍යාත ජනගහනයක් සිටින, අලුතින් විවෘත වූ වෙළඳපොළක් ලෙස, වෙළඳපොළ හැකියාවන් ව්‍යාප්ත කිරීමටත් ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික නිෂ්පාදන පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමටත් මෙම අවස්ථාව යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

**මෙම ප්‍රදර්ශනය කා සඳහාද**

චීන මහජන සමූහාණ්ඩුවේ රේගු මහජන පරිපාලනය (GACC) හි ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති, පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩ යටතේ ජාත්‍යන්තර වෙළඳපොළට සැපයීමට ප්‍රමාණවත් නිෂ්පාදන ධාරිතාවක් සහ ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම්කරුවන්ගෙන්/අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

- සකස් කළ සහ නැවුම් පලතුරු හා එළවළු (ශීත කළ, විජලනය කළ සහ සංරක්ෂණය කළ පලතුරු හා එළවළු, පලතුරු යුෂ, කෑන් සහ බෝතල් කළ නිෂ්පාදන)
- පොල් ආශ්‍රිත නිෂ්පාදන (කුඩු කළ පොල්, පොල්කිරි, ක්‍රීම් සහ පිටි, පොල්/තැඹිලි වතුර, රසකැවූ පොල් චිප්ස් ආදිය)
- කුළුබඩු සහ කුළුබඩු මිශ්‍රණ (ලංකා කුරුඳු, කුළුබඩු මිශ්‍රන, තැගි පැකේජ ලෙස ඇති කුළුබඩු, ආහාර ද්‍රව්‍ය, ක්ෂණික කුළුබඩු සූදනම් කිරීම් ඇතුළත්ව)
- පැණිරස කෑම (Confectionery) සහ බේකරි නිෂ්පාදන, විශේෂිත පහසු ආහාර නිෂ්පාදන, ධාන්‍ය සහ ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන, සෞඛ්‍යාරක්ෂිත ආහාර, පෝෂණ අතිරේක (food supplements)
- පාන වර්ග (ඖෂධීය තේ වර්ග, මධ්‍යසාර නොවන පාන වර්ග, ඖෂධීය පාන වර්ග)

**සහභාගීත්ව පිරිවැය**

ඉඩකඩ සහ කුටි ඉදිකිරීම් පිරිවැය මෙන්ම ඊට අදාළ සියලුම වියදම් සහභාගී වන සමාගම් විසින් දැරිය යුතුය. අරමුදල් පවතින බව මත පදනම්ව, තෝරාගත් සුළු හා මධ්‍යම පරිමාණ (SME) සමාගම් සඳහා ඉඩකඩ/ඉදිකිරීම් පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය ආධාර ලබා දීමට EDB ආයතනය සලකා බැලීමට ඉඩ ප්‍රස්ථාව ඇත.

**අයදුම් කිරීම සහ තෝරා ගැනීම**

අයදුම්පත් EDB වෙබ් අඩවිය වන www.srilankabusiness.com හි ("Announcements" අංශය යටතේ) ඇති නියමිත ආකෘති පත්‍රය ඔස්සේ සිදු කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2026 අගෝස්තු 12 දින**ට හෝ ඊට පෙර, කවරයේ ඉහළ වම්පස කෙළවරේ "Hainan Winter Trade Fair 2026" ලෙස සඳහන් කර "**අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්ම, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**" වෙත ලැබීමට සැලැස්විය යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා EDB විසින් පත් කරන ලද මණ්ඩලයක් මගින් කෙටි ලැයිස්තුගත කිරීමෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ඇත.

**වැඩිදුර විස්තර සඳහා කරුණාකර ගයාන් වීරසිංහ මහතා/ සහකාර අධ්‍යක්ෂ අමතන්න: 077-2120943, 011-2300732, 011-2300705-11 (දිගුව: 386). විද්‍යුත් තැපෑල:** gayanw@edb.gov.lk.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**නො 42, EDB/NDB කුලුණ, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**